විශිෂ්ට පරමාදර්ශී අභිමානවත් පළාත් සභා රාජ්‍ය සේවයක්

**පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව - බස්නාහිර පළාත**

மாகாண சபை அரசாங்க சேவை ஆணைக்குழு – மேல் மாகாணம்

**PROVINCIAL COUNCIL PUBLIC SERVICE COMMISSION – WESTERN PROVINCE**

අංක 628,10 වන මහල,ජන ජය සිටි ගොඩනැගිල්ල,නාවල පාර,රාජගිරිය இல.628, 10 வதுமாடி, ஜனஜயசிட்டிகட்டிடம், நாவலவீதி, ராஜகிரிய No.628,10th Floor,Jana Jaya City Building,NawalaRoad,Rajagiriya


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My Ref. | WPC/PSC/REC05/05-2024(ii) | ඔබේ අංකය<br>உமது இல.<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2026.02. 20 |

**<u>බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කළමනාකරණ සේවා නිලධාරී සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය - 2024 – III අදියර</u>**

2024.08.18 දින ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වන ලද උක්ත සඳහන් තරඟ විභාගයේ ප්‍රතිඵල මත මේ සමඟ පළ කර ඇති නාමලේඛනයේ නම් සඳහන් අයදුම්කරුවන් සීමිත පදනම මත බස්නාහිර පළාත් රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරී තනතුරේ III ශ්‍රේණියට පත් කිරීම සම්බන්ධයෙන් සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණය **2026.03.04** දින පෙ.ව.**10.00** ට බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදී පැවැත්වීමට කටයුතු යොදා ඇත. සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීමේ ලිපිය ඔබගේ සේවා ස්ථානය වෙත යොමු කර ඇත.

02. ඔබ විසින් අයදුම්පතෙහි සඳහන් කල ජංගම දුරකථන අංකය සඳහා නිල කෙටි පණිවිඩයක් මගින්ද සම්මුඛ පරීක්ෂණ පැවැත්වෙන දිනය හා වේලාව දන්වා ඇත. නියමිත දින නියමිත වේලාවට ඒ සඳහා සහභාගී වන ලෙස මෙයින් දන්වනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණෙන විට පහත සඳහන් ලියවිලිවල මුල් පිටපත් රැගෙන ඒම අනිවාර්යය වේ. පෞද්ගලික ලිපිගොනුව පවත්වාගෙන යන සේවා ස්ථානයේ ප්‍රධානියා විසින් සහතික කරන ලද ඡායා පිටපත් මේ සමඟ පළ කර ඇති ආකෘති පත්‍ර 01 සමඟ එවීම ප්‍රමාණවත් වේ.

i. ජාතික හැඳුනුම්පත, වලංගු රියදුරු බලපත්‍රය හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය

ii. උප්පැන්න සහතිකයේ මුල් පිටපත

iii. විභාග අයදුම්පත සම්පූර්ණ කිරීමේදී උපයෝගී කරගත් සියලුම අධ්‍යාපන සහතිකවල මුල් පිටපත් (අ.පො.ස. සා.පෙළ සහ අ.පො.ස. උ.පෙළ සහතික ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද සහතික විය යුතුය)

iv. ඉහත i, ii සහ iii හි සඳහන් ලියවිලිවල සහතික කරන ලද ඡායා පිටපත්

v. දැනට ඔබ දරන තනතුරේ පත්වීම් ලිපිය, වැඩ භාර ගැනීමේ ලිපිය, සේවය ස්ථිර කිරීමේ ලිපිය, කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත් ලිපි හා අන්තර්ග්‍රහණය සිදු කර තිබේනම් ඊට අදාළ ලේඛනවල මුල් පිටපත් සහ සහතික කරන ලද ඡායා පිටපත් (වසර 05ක සතුටුදායක සේවා කාලය තහවුරු කිරීම සඳහා නියමිත දිනට වැටුප් වර්ධක උපයාගත් බව දැක්වෙන වැටුප් වැඩි කිරීමේ සහතික පත්‍රවල සහතික කළ පිටපත් ඉදිරිපත් කළ යුතු ය.)

vi. ඔබ භාවිතා කරන නමෙහි සහ උප්පැන්න සහතිකයේ සහ අනෙකුත් සහතිකවල සඳහන් නමෙහි වෙනසක් ඇත්නම් එම වෙනස පැහැදිලි කිරීම සඳහා විධිමත් ආකෘතියකින් යුත් රු.50/-ක අවලංගු නොකරන ලද මුද්දරයක් මත ඔබගේ අත්සන තබා සාමදාන විනිසුරුවරයකු හෝ දිවුරුම් කොමසාරිස්වරයකු විසින් සහතික කරන ලද දිවුරුම් ප්‍රකාශයක්

03. මේ සමඟ පළ කර ඇති ආකෘති පත්‍ර 01 ඔබගේ පෞද්ගලික ලිපිගොනුව පවත්වාගෙන යන සේවා ස්ථානයේ ප්‍රධානියා විසින් සම්පූර්ණ කර මුද්‍රා තබා සම්මුඛ පරීක්ෂණ දින රැගෙන ආ යුතුය. එසේම ඉහත iv හා v සඳහන් ලේඛන සත්‍ය පිටපත් බවට සහතික කළ යුත්තේ ද එම සේවා ස්ථානයේ ප්‍රධානියාම වේ. උදාහරණයක් ලෙස පළාත් පාසලක සේවය කරන නිලධරයකු සම්බන්ධයෙන් එම කටයුතු කළ යුත්තේ අදාළ කලාප අධ්‍යාපන කාර්යාලයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ මගිනි. --


| ලේකම්<br>செயலாளர்<br>Secretary<br>011 2879528 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්<br>சிரேஷ்ட உதவிச் செயலாளர்<br>Senior Assistant Secretary<br>011 2879317 | සහකාර ලේකම්<br>(බඳවාගැනීම්)<br>உதவிச் செயலாளர்<br>(ஆட்சேர்ப்பு)<br>Assistant Secretary<br>(Recruitment)<br>011 2879610 | සහකාර ලේකම්<br>(ආයතන)<br>உதவிச் செயலாளர்<br>(தாபனம்)<br>Assistant Secretary<br>(Establishment)<br>011 2879538 | පරිපාලන නිලධාරී<br>நிர்வாக உத்தியோகத்தர்<br>Administrative Officer<br>011 2879517 | කාර්යාලය / அலுவலகம் / Office: 011 2879613, 011 2879614<br>ෆැක්ස් / பெக்ஸ் / Fax: 011 2879512<br>ඊ-මේල් / மின்னஞ்சல் / E-Mail: ppscwpsc@sltnet.lk |
|---|---|---|---|---|---|

04. පත්වීමක් ලැබීම සඳහා අංක 1898/5 හා 2015.01.19 දිනැති බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කළමනාකරණ සේවා නිලධාරි සේවා ව්‍යවස්ථා සංග්‍රහය හා එම ව්‍යවස්ථාවට සිදු කර ඇති සංශෝධනවල සඳහන් විධිවිධාන සහ අංක 2382 දරණ 2024.04.26 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද උක්ත තරඟ විභාග නිවේදනය ප්‍රකාරව සහ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක WPC/PSC/REC05/05-2024 හා 2024.05.09 දිනැති ලිපිය සඳහන් විධිවිධාන ප්‍රකාරව අදාළ තනතුර සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සපුරා තිබිය යුතුය.

05. නියමිත දිනයේ සම්මුඛ පරීක්ෂණයට නොපැමිණීම පත්වීමක් ලබාගැනීම සඳහා අපේක්ෂාවක් නොමැති සේ සලකනු ලබන අතර, ඒ සම්බන්ධයෙන් පසුව කරනු ලබන කිසිදු විමසීමක් මොනම කරුණක් මත හෝ සලකා බලනු නොලැබේ.

06. මෙම සම්මුඛ පරීක්ෂණය සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා කැඳවීමක් පමණක් වන අතර, එය පත්වීමක් ලබා ගැනීමට ඇති අයිතියක් නොවන බවද, මෙම ලිපිය නිකුත් කිරීමෙන් පමණක් පත්වීමක් ලැබීමට සුදුස්සකු නොවන බවද අවධාරණය කරනු ලැබේ. එසේම මෙම සම්මුඛ පරීක්ෂණයට පැමිණීම වෙනුවෙන් ගමන් වියදම් හෝ වෙනත් කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.

07. මෙම කැඳවීම අනුව ඔබ නොපැමිණෙන්නේ නම්, ඒ බව සම්මුඛ පරීක්ෂණයට පෙර ලිඛිතව හෝ ppscwprec@gmail.com යන විද්‍යුත් තැපැල් ලිපිනයට විද්‍යුත් තැපැල් පණිවිඩයක් මගින් මා දැනුවත් කරන මෙන් දන්වා සිටිමි.

08. සියලුම අයදුම්කරුවන්ට අදාළ කැඳවීම් ලිපි තැපැල් මගින් යොමු කිරීමට කටයුතු කරන අතර යම් හෙයකින් එම ලිපිය ලැබීමට ප්‍රමාද වන්නේනම් මෙම දැන්වීම අනුව සම්මුඛ පරීක්ෂණයට අවශ්‍ය ලේඛන පිළියෙල කර ගන්නා ලෙස කාරුණිකව දන්වා සිටිමි.

තිලක් සෙනරත්
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

Tel – 0112879614
Fax – 0112879512
email – ppscwprec@sltnet.lk